අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/967/2020 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2020.04.23

**චක්‍රලේඛ අංක :- 14/2020**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර අධ්‍යාපන නිලධාරීවරුන්,
සයලු ම පරිවෙණාධිපති ස්වාමීන් වහන්සේලා,
සියලු ම විදුහල්පතිවරුන්,
සියලු ම පෞද්ගලික පාසල් ප්‍රධානීන්,

## "රටක් වටින පොතක්" ලිවීමේ ජාතික වැඩසටහන.

2020 වර්ෂයේ ලොව පුරා පැතිර යන COVID 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් අප රටේ හතළිස්තුන් ලක්ෂයකට ආසන්න පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තම නිවෙස්වලට ම වී කාලය ගත කරන අතර ඔවුන්ගේ චිත්ත ශක්තිය, අභියෝග ජය ගැනීමේ ශක්තිය හා නිර්මාණ ශක්තිය වර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන හඳුන්වා දෙනු ලැබේ. මෙම වකවානුවේ සිසු දරුවන්ගේ සිත් තුළ බලපැවැත්වෙන "රටක් වටින අදහස්" එක්කර ග්‍රන්ථයක් ලෙස එළිදැක්වීමට ඔවුන්ට අවස්ථාව සලසා දීමත්, පොතපත කියවීමෙන් මෙම කාලය තුළ තම දැනුම, යහපත් ආකල්ප හා කුසලතා වර්ධනය කරගෙන එය නිර්මාණාත්මක ලෙස ජාතිය වෙත පිරිනැමීමත්, අංකුර ලේඛක-ලේඛිකාවන් පිරිසක් පාසල් පද්ධතිය තුළින් බිහි කරලීමත් මෙම වැඩසටහන ආරම්භ කිරීමේ අරමුණු වෙයි. මෙම වැඩසටහන සඳහා දිවයිනේ සියලු ම පාසල්, පිරිවෙන්, පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් වල ඉගෙනුම ලබන පළමුවන ශ්‍රේණියේ සිට දහතුන්වන ශ්‍රේණිය දක්වා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ස්වකීය නිර්මාණ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන ඕනෑ ම භාෂා මාධ්‍යයකින් ඉදිරිපත් කළ හැකි ය. මෙම වැඩසටහන පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක කෙරේ.

### 02. පාසලේ කාර්යභාරය :-

පාසල් ඇගයීමේ කමිටුවක් විදුහල්පතිගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ගත යුතුය. එම ඇගයීම් කමිටුවේ සභාපතිවරයා විදුහල්පතිවරයා හෝ ඔහු විසින් නම් කරන ලද නියෝජ්‍ය විදුහල්පතිවරයෙක් විය යුතුය. ඊට අමතරව අදාළ භාෂා විෂය භාර ප්‍රවීණ ආචාර්යවරයා සහ පාසල් පුස්තකාල භාර ගුරුභවතා සමඟ විෂය ප්‍රවීණ ගුරුවරුන් දෙදෙනෙකු සහිත 05 දෙනෙකුගෙන් කමිටුව සමන්විත වේ. සිසුන්ගේ නිර්මාණ ඇගයීමට ලක් කිරීම මෙම කමිටුවේ කාර්යය වේ. විදුහල්පතිවරයා විසින් සිසුන් නිර්මාණකරණයට යොමු කරවීම සඳහා සියලුම ගුරුභවතුන් දැනුවත් කිරීම කළ යුතුය. පන්තියේ සියලුම දරුවන් නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා උනන්දු කරවීම පන්තිභාර ගුරුවරයාගේ වගකීම වන අතර සිසුන් විසින් ඉදිරිපත් කරන අත් පිටපත් පන්ති භාර ගුරුවරයා විසින් ශිෂ්‍යයාගේ ම ස්ව නිර්මාණයක් බවට සහතික කර පාසල් ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. පාසල් ඇගයීම් කමිටුවෙන් තෝරා ගත් සාර්ථක නිර්මාණ කොට්ඨාස භාර අධ්‍යාපන නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වැඩසටහන පිළිබඳ පාසල් මට්ටමේ කටයුතු අධීක්ෂණය හා එහිදී මතුවිය හැකි ගැටලු පිළිබඳ තීරණ ගැනීමේ බලය කොට්ඨාස භාර අධ්‍යාපන නිලධාරීවරයා සතුවෙයි.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

කොට්ඨාස භාර අධ්‍යාපන නිලධාරී විසින් පාසල්වලින් ලබා දෙන ප්‍රශස්ත කෘති පාසල්වල සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ශිෂ්‍යයින් 200ට අඩු, 201 සිට 500 දක්වා සහ 500ට වැඩි ලෙස කාණ්ඩ කළ යුතුය. එම කාණ්ඩ නැවතත් 01 සිට 05 ශ්‍රේණිය දක්වා, 06 සිට 10 ශ්‍රේණිය දක්වා සහ 11 සිට 13 ශ්‍රේණිය දක්වා ලෙස බෙදා ඉසව් 09ක් අනුව වර්ග කර කලාප අධ්‍යාපන කාර්යාලයට භාර දිය යුතු ය.

## 03. කලාප අධ්‍යාපන කාර්යාලයේ කාර්යභාරය :-

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරන ලද නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු, පාසල් පුස්තකාල සංවර්ධන විෂය භාර අධ්‍යාපන නිලධාරී, අදාළ භාෂා (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) විෂය භාර නිලධාරී හා ග්‍රන්ථ කතුවරයෙකු හෝ අදාළ භාෂා ප්‍රවීණයකු ද, අදාළ විෂය භාර අධ්‍යාපන නිලධාරියෙකු ද ඇතුලු 05 දෙනෙකුගෙන් යුතු ඇගයීම් කමිටුවක් පත්කර ගත යුතු ය. කොට්ඨාස භාර නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ශිෂ්‍ය නිර්මාණ, මෙම කමිටුව මඟින් ඇගයීමට ලක් කර නියමිත දිනයට පෙර ඇගයීම්වල ලකුණු වාර්තා ද සමඟ තෝරාගත් ප්‍රශස්ත කෘති පහත අංක 06 යටතේ දැක්වෙන වැඩසටහනට අදාළ කොන්දේසිවලට අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

## 04. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය :-

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරන ලද නියෝජිතයෙක්, පළාත් පාසල් පුස්තකාල සංවර්ධන විෂය භාර නිලධාරී, අදාළ භාෂා විෂය භාර නිලධාරී (සිංහල/දෙමළ/ඉංග්‍රීසි), ග්‍රන්ථ කතුවරයෙකු හෝ අදාළ භාෂා ප්‍රවීණයකු ද, අදාළ විෂය භාර අධ්‍යාපන නිලධාරියකු ද ඇතුළත් පංච පුද්ගල ඇගයීම් කමිටුවක් පත්කර ගත යුතු ය. එම කමිටුවෙන් තෝරා ගත් ප්‍රශස්ත ම නිර්මාණ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන අංශය වෙත ඇගයීම් ලකුණු වාර්තා සහ අත් පිටපත් සමඟ මෘදු හා දෘඩ පිටපත් නියමිත දිනට පෙර එවිය යුතුය.

## 05. නියමිත කාලසටහන :-

මෙම වැඩසටහනේ නිර්මාණ භාර දිය යුතු කාල සටහන හා අවසන් දිනයන්

| | | 2020 වර්ෂය සඳහා | 2021 වර්ෂය සහ ඉන් ඉදිරියට |
|---|---|---|---|
| 01 | පාසල් නිර්මාණ ඇගයීම් කොට්ඨාස කාර්ය භාර දෙන අවසාන දිනය | ජූනි 30 | මැයි 31 |
| 02 | කොට්ඨාස කාර්යාලය මඟින් කලාප කාර්යාලයට භාර දිය යුතු අවසාන දිනය | ජූලි 15 | ජූනි 15 |
| 03 | කලාප ඇගයීම් සිදු කර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතු අවසාන දිනය | අගෝස්තු 15 | ජූලි 15 |
| 04 | පළාත් ඇගයීම් අවසන් කර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එවිය යුතු අවසාන දිනය | සැප්තැම්බර් 15 | අගෝස්තු 15 |
| 05 | ජාතික ප්‍රතිඵලය නිකුත් කළ යුතු දිනය | ඔක්තෝබර් 15 | සැප්තැම්බර් 15 |

## 06. වැඩසටහනට අදාළ කොන්දේසි :-

6.1. 01 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා සියලු ම සිසු-සිසුවියන් ට මේ සඳහා ඉදිරිපත් විය හැකිය. 01 සහ 02 ශ්‍රේණිය වල සිසුන්ගේ තෝරාගත් නිර්මාණ ඇතුලත් කර සකස් කරන ලද නිර්මාණ සංග්‍රහයක් (චිත්‍ර/ කවි/ ළමා කතා/ චිත්‍ර කතා/ කාටුන් ආදී ළමා නිර්මාණ ඇතුළත්) ලෙස ඉදිරිපත් කළ හැක.

6.2. 03 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා සියලු සිසුන් ට පහත සඳහන් ශානරවලින් එකක් තෝරාගෙන නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.

**පොත් වර්ග (ශානර)**

| | | |
|---|---|---|
| ළමා කතන්දර | කාව්‍ය රචනා | යොවුන් සාහිත්‍ය කෘති |
| කෙටිකතා | නවකතා | නාට්‍ය රචනා |
| පරිවර්තන | ඓතිහාසික කතා | මායා කතා |
| මිථ්‍යා කතා | අභිරහස් කතා | උපමා කතා |
| ජන කතා | විද්‍යා ප්‍රබන්ධ | පරිසර විත්ති |
| චරිතාපදාන | ස්වයංචරිතාපදාන | සුරංගනා කතා |
| අතිශයෝක්ති කතා | ආගමික කතා | වීර කතා |
| විෂයානුබද්ධ පොත් | පුරාවෘත්ත | මිශ්‍ර |

6.3. සෑම නිර්මාණයක් ම තම අත් අකුරින් ලියන ලද පිටපතක් හා පරිගණක ගත කළ පිටපත ද ඉදිරිපත් කළ යුතු ය. පරිගණක ගත කළ මෘදු පිටපත ඉදිරිපත් කිරීමේ දී එහි දෘඩ පිටපත ද ඉදිරිපත් කළ යුතු ය. (පරිගණක ලියනය කර නොතිබීම වැඩසටහනෙන් ඉවත්වීමට හේතුවක් නොවේ)

6.4. කෙටිකතා සංග්‍රහයක් නම්, අවම වශයෙන් කෙටි කතා 5 ක් ඇතුළත් විය යුතු ය.

6.5. කාව්‍ය සංග්‍රහයක් නම් පද්‍ය හෝ නිසඳැස් කවි පංති, 20 - 50 අතර විය යුතු ය.

6.6. නවකතාවක් නම්, පරිගණකගත කළ පසු A5 පිටු අවම වශයෙන් පිටු 120 ක් පැවතිය යුතු ය.

6.7. ළමා කතන්දර පොතක A4 පිටු 16 ක් වත් තිබිය යුතුයි. අනිකුත් පොත්වල පිටු ගණන 49ට වැඩි හා 150ට අඩු විය යුතු ය.

6.8. ළමා කතන්දර නිර්මාණ ඉදිරිපත් කරන්නේ නම්, වර්ණ පිටු හා චිත්‍ර සහිත විය යුතු ය.

6.9. පරිගණක යතුරු ලියනය කරන්නේ නම් අකුරු වර්ගය Iskoole Pota විය යුතු ය.

6.10. ළමා කතන්දරවල පරිගණක අකුරු ප්‍රමාණය 14 විය යුතුයි. අනෙක් පොත්වල අකුරු ප්‍රමාණය 12 විය යුතුයි. පේළි අතර පරතරය 1.5 ක් විය යුතු ය.

6.11. මාතෘකාවක් හා පේළිය අතර පරතරය 02 ක් විය යුතු ය.

6.12. ලියනු ලබන පිටුවක වට ඉඩ ප්‍රමාණය පහත පරිදි විය යුතු ය. වම් අත අඟල් 1.5 ක ඉඩක් ද, ඉතිරි තුන් පැත්ත අඟල බැගින් ඉඩක් ද තබා ලිවිය යුතු ය.

6.13. ඡායාරූප ඇත්නම් ඒවා කළු සුදු හෝ වර්ණ ඡායාරූප විය යුතුයි. වර්ණ ඡායාරූප 4 colours විය යුතුයි. ඡායාරූප දක්වා ඇති අවස්ථාවල කිසිදු පුද්ගලයකු පෞද්ගලික ව හඳුනා ගැනීමට නොහැකි වන ආකාරයේ ඡායාරූප පමණක් එකතු කළ යුතුය.

6.14. නිර්මාණය සඳහා භාවිත කරන සියලු නම් ගම් මනඃකල්පිත විය යුතුය.
.
6.15. පිට කවරය වර්ණ ඡායාරූප වලින් හෝ චිත්‍ර වලින් සැකසිය හැකිය.

6.16. කවි පොත් චිත්‍ර සහිත හෝ රහිත විය හැකිය. එහෙත් ඒවා clip art නොවිය යුතුය.

6.17. අතින් ලියන ලද නිර්මාණ ඉදිරිපත් කිරීමේ දී පොතක් ලෙස බැඳ තිබිය යුතුය. එය දෘඩ පිටපතක් ලෙස ද ඉදිරිපත් කළ හැකිය. නමුත්, සිසුන් විසින් තම නිර්මාණ ඉදිරිපත් කිරීමේ දී මෘදු පිටපතක් සකස් කර ගැනීම ට නොහැකිවීම, මෙම වැඩසටහනට ඇතුලත්වීමට කිසිදු බාධාවක් කර නොගත යුතුය. එවැනි අවස්ථාවක දී අතින් ලියන ලද පිටපත භාරගෙන ඉදිරි ඇගයීම් සිදු කිරීම ට විදුහල්පති ඇතුළු සියලු ම නිලධාරීන් කටයුතු කළ යුතුය.

6.18. කලාපයේ ඇගයීම් මණ්ඩලය විසින් තෝරාගන්නා නිර්මාණවල මෘදු පිටපත් (CD) සංයුක්ත තැටි මගින් හෝ ඉදිරිපත් කළ හැකි අතර විද්‍යුත් තැපැලෙන් pdf ලියවිල්ලක් ආකාරයට ද, පළාත වෙත ඉදිරිපත් කළ හැකිය. එලෙස ම පළාත් ඇගයීම් මණ්ඩලය මඟින් තෝරා ගන්නා නිර්මාණ ඉහත ආකාරයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ හැකිය.

6.19. මින් පෙර කිසිදු අවස්ථාවක ප්‍රසිද්ධ ලියවිල්ලක් ලෙසින් ප්‍රකාශයට පත් කරන ලද නිර්මාණයක හෝ කෘතියක කොටසක් නිසි පරිදී උපුටා දැක්වීමකින් තොරව හෝ නිසි අවසරයකින් තොරව පළ කිරීම හෝ තම නිර්මාණයක ඇතුළත් කිරීම නොකළ යුතුය.

6.20. 11 සිට 13 ශ්‍රේණි කාණ්ඩය සඳහා විෂයානුබද්ධ පොත්, ව්‍යාපෘති හෝ පර්යේෂණ වාර්තා ද ඉදිරිපත් කළ හැකිය. ඒ සඳහා පහත අංක 6.20, 6.21, 6.22 පරිදී කටයුතු කළ යුතුය.

6.21. විෂය කරුණු සහිත පොත් සඳහා පැහැදිලි කිරීම් අවශ්‍ය අවස්ථාවල පමණක් ඡායාරූප හා චිත්‍ර ඇතුළත් කළ යුතුය.

6.22. උපුටා ගැනීම් දැක්වීමේ දී ආශ්‍රිත ග්‍රන්ථ නාම ලේඛනයක් ඇමිණිය යුතුය. එහිදී APA ක්‍රමය හෝ Harvard ක්‍රමය අනුගමනය කළ යුතුය.

ඔබට අවශ්‍ය නම් පහත උදාහරණය බලන්න.

| | |
|---|---|
| කතුවරයාගේ නම | :- පී. තේනබදු |
| වර්ෂය | :- 1959 |
| පොතේ නම | :- සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය |
| ප්‍රකාශකයා | :- කොළඹ ඇපොතිකරීස් සමාගම |
| ප්‍රකාශිත නගරය | :- කොළඹ. |

මෙම තොරතුරු ආශ්‍රිත ග්‍රන්ථ නාම ලේඛනයක සඳහන් කරන්නේ මෙසේය.

තේනබදු, පී . (1959 ). *සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය*. කොළඹ : ඇපොතිකරීස්.
යන ආකාරයට ය.

6.23. එම කාණ්ඩයේ ඉදිරිපත් කරනු ලබන පොත්පත් අතර ව්‍යාපෘති හෝ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා වන ආචාර ධර්ම ඔබ විසින් පිළිපැදිය යුතුය.

6.24. වෙනත් ඇමුණුම් දක්වන විට එම ඇමුණුම්වලට අංක ලබා දී, ඒ අනුව අත් පිටපතට අමුණා තිබිය යුතු ය. ඇමුණුම් ද එකතු කරන්න.

6.25. ඔබගේ කෘතියේ පිටු පහත පරිදි සකස් කළ යුතු වේ.

i. **මුල් පිටුව :-** පොතේ නම, කතුවරයාගේ නම හා මුල්පිටුවේ චිත්‍රය ඇතුළත් විය යුතුය.
ii. **දෙවන මුල් පිටුව :-** පිට කවරයට අමතරව එවැනිම මුල් පිටුවක් සකස් කරන්න. (පොතේ නම, කතුවරයාගේ නම, ප්‍රකාශකයාගේ නම සහිතව)
iii. **පිදුම :-** ඔබට අවශ්‍ය අයෙකුට පොත පිදිය හැකිය. "මගේ මෙම පොත ...............වෙත ඉතා ආදරෙන් පුදකරමි" වැනි වැකියක් යොදා ගත හැකිය.

iv. **ස්තුතිය :-** මෙම පොත එළිදැක්වීමට ඔබට උපකාර කළ අයට ස්තූතිය පළ කිරීමට යොදාගැනේ. (A -4 පිටුවකට සීමා විය යුතුය.)

v. **පෙරවදන :-** පොත හා කතුවරයා පිළිබඳ ලියන ලද විස්තරයකි. (A 4 පිටු දෙකකට වඩා යොදා නොගැනීමට වගබලා ගතයුතුය.)

vi. **පටුන :-** ප්‍රධාන මාතෘකා අනුමාතෘකා පිටු අංක සහිතව දැක්විය යුතුය. (ළමා කතන්දර පොත් සඳහා අදාල නොවේ.)

පටුන දක්වා පිටු අංක කිරීම **රෝම ඉලක්කම්වලින්** ද, එතැන් සිට **හින්දු අරාබි ඉලක්කම්වලින්** ද කළ යුතු ය.

ග්‍රන්ථකරණය පිළිබඳ වැඩි දුර තොරතුරු දැනගැනීම සඳහා http://www.natlib.lk, http://www.moe.gov.lk, යන වෙබ් අඩවි පරිශීලනය කළ හැකි අතර වැඩි දුර තොරතුරු සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ශාඛාව හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙන් විමසිය හැකි වේ.

## 07. කෘති ඇගයීම් කර සම්මාන පිරිනැමීම සඳහා අදාළ නිර්ණායක :-

7.1. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ඇගයීම්වලින් පසුව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එවනු ලබන ප්‍රශස්ත මට්ටමේ කෘතිවලින් ජාතික මට්ටම දක්වා තෝරා ගත් හොඳම කෘති 10,000 විද්‍යුත් කෘති බවට පත් කර විද්‍යුත් පුස්තකාලයට ඇතුළත් කරනු ලැබේ. ඒ සමග ම සහභාගිත්ව සහතික පත්‍ර ද පිරිනමනු ලැබේ.

7.2. එම කෘති 10,000 අතරින් එක් එක් කාණ්ඩ යටතේ තෝරාගත් හොඳම කෘති 1,000කට කුසලතා සහතික ද පිරිනමනු ලැබේ.

7.3. එම වලින් විශිෂ්ටතම කෘති 100ක් තෝරාගෙන විශිෂ්ට සම්මාන පිරිනමනු ලැබේ. මෙම කෘති අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා අදාළ සියලුම නිලධාරීන්ගේ සහාය අපේක්ෂා කරන අතර, මෙය ජාතික වැදගත්කමකින් යුත් කටයුත්තක් සේ සලකා ක්‍රියා කළ යුතු බව දන්වමි. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන පිටපත් වල සඳහන් කරුණු අතර යම් නොගැලපීමක් හෝ ගැටලු සහගත අවස්ථාවක් ඇති වුවහොත් සිංහල පිටපත නිවැරදි සේ සලකා කටයුතු කළ යුතුය.

මෙම සම්පූර්ණ කාර්ය සම්බන්ධීකරණය කරනු ලබන්නේද අධ්‍යාපන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගිනි.

**අත්/කළේ එන්. එච්. එම්. චිත්‍රානන්ද**

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.